# හැඳින්වීම

1956 සිදුවුනේ බමුණු කුලය බිඳ වැටීමක්ද? 56 දී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමෙන් දෙමළ ජනයාට අසාධාරණයක් සිදු වී ද? මේ ආදී ප්‍රශ්න ගණනාවක් 56 සම්බන්ධයෙන් දේශපාලන සංස්කෘතික තලයන්හි දී නිතර නිතර මතුවෙයි. 56 දී සිදුවන්නේ ආණ්ඩු මාරුවක් පමණක් ද? එජාපය ආසන අටකට බැස්සේය, ම.එ.පෙ. 56 දී ආණ්ඩු බලය අත්පත් කර ගැනීම, මැතිවරණයක දී සාමාන්‍යයෙන් සිදුවන සංසිද්ධියෙන් ඔබ්බට නොගිය සිද්ධියක් ද? කොසේ වුවත් පොදුවේ ගත් කල සෑම **දේශපාලන ගුරු කුලයක්** ම පාහේ 56, විප්ලවයක් සේ සලකනු දැකිය හැකි ය. එසේ නම් සත්‍ය වශයෙන් ම 56 සිදු වූයේ කුමක් ද?

ලොකු සතු හේවණේ මෙත්තානන්ද හෙවත් එල්.එච් මෙත්තානන්ද ගේ මෙහෙවර පිළිබඳ ව කතිකාවතකට මුලපිරිය හැක්කේ ඒ ප්‍රශ්නයෙන් බව අපි සිතමු. 1948 දී ඩොමිනියන් තත්ත්වයෙන් නිදහසක් ඉංග්‍රීසින් විසින් ලංකාවට පිරිනමන ලද්දේය. මේ නිදහස පිරිනැමුණේ, මෙරට තිබූ රාජාණ්ඩු පාලන ක්‍රමය තුළ නොව ඉංග්‍රීසින් විසින් අලුතෙන් ඇති කරන ලද පාලන තන්ත්‍රයක් තුළ ය. සර්ව ජන ඡන්ද බලය ලැබී තිබුණ මුත් ඉංග්‍රීසින් ලබා දුන් සෙසු ක්‍රමය තුළ පාලන ක්‍රමය තීරණය වූ නිසාවෙන් ඡන්දයෙන් පාලකයන් පත් වූව ද සම්පූර්ණ කටයුතු සිදුවූයේ බ්‍රිතාන්‍යයන් ගේ සැලසුම් මත ය. ඒ වන විටත් බ්‍රිතාන්‍යයන් බිහි කොට තිබූ පරිපාලන නිලධාරි තන්ත්‍රය හා පළාත් බෙදීම් ආදිය හේතුවෙන් බ්‍රිතාන්‍යයන් ගේ පාලනය හා 1948න් පසු පාලනය අතර එතරම් වෙනසක් ඇති නොවී ය. එය හුදෙක් බ්‍රිතාන්‍යයන් ගේ අතේ තිබූ පාලනය බ්‍රිතාන්‍යයන්ට රුචි අනුගාමිකයන් පිරිසකට පැවරීමට පමණක් සීමා වී තිබිණි. 1956 විප්ලවීය වසරක් වන්නේ මේ අරුතිනි. ඩොමිනියන් තත්ත්වයේ තිබූ නිදහස දිනා ගත්තක් නොවීය.එය බ්‍රිතාන්‍යයන් විසින් ප්‍රදානය කරන ලද්දක් විය. 1815 සිට ම බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස දිනාගැනීමට සටන් කළ ජාතික ව්‍යාපාරයට මේ නිදහස තම අවශ්‍යතාව සපුරාගැනීමක් නොවීය. '56 **අයත් වන්නේ** ඒ ජාතික ව්‍යාපාරයේ දේශපාලනික නැගිටීමක් ලෙස ය.'56 ජාතික ව්‍යාපාරයේ ජයග්‍රහණයක් වන්නේ කෙසේ ද යන්න පෙන්වා දීම වැදගත් ය. එය **ම.එ.පෙ.** හෝ **ශ්‍රී.ලං.නි.**යේ හෝ ජයග්‍රහණයක් බවට ඒ ඒ පක්ෂ විසින් ප්‍රචාරය කරමින් සිටියි. එම පක්ෂ ද 56 ජයග්‍රහණයේ කොටස් කරුවන් වුවත් ඔවුන්ට අයිති වන්නේ **නොගැනිය** හැකි තරමේ කුඩා කොටසකි.

එසේ නම් '56 ජයග්‍රහණයේ සැබෑ නියමුවෝ කවුරුන්ද? 1951 සැප්තැම්බර් දෙවෙනි දා ශ්‍රීලනිපය බිහි විය. එය දණගාන්නටත් පෙර, මහ මැතිවරණ අභියෝගයකට මුහුණ දුන්නේ ය. 1952 මැයි මස 24,26,28, හා 30 දින වල පැවති මේ මහ මැතිවරණයේදී ශ්‍රීලනිපයට දිනා ගැනීමට හැකි වූයේ ආසන නවයක් පමණි. මැතිවරණයෙන් එජාපය 44.08% ක් ඡන්ද ප්‍රතිශතයක් ද සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂ 18.89% ක් ද ශ්‍රීලිනිපය 15.52%ක ඡන්ද ප්‍රතිශතයක් ද ලබා ගත්තේය. එජාපය ආසන පනස් හතරක් ද සම සමාජ පක්ෂය ආසන නවයක් ද දිනා ගත් මේ මහ මැතිවරණයෙන් ශ්‍රීලනිපයට දිනාගත හැකි වූයේ ආසන නවයක් පමණි. ශ්‍රීලනිපය මුහුණ දුන් මේ පරාජය හේතුවෙන්, එය පිහිටුවීමට මුල් පියවර තැබූවන් ගෙන් අයකු වන ශ්‍රීලනිපයේ සම ලේකම් බර්නාඩ් අලුවිහාරේ පක්ෂය හැර දමා ගියේය.

1954 ඔක්තෝබර් මාසයේ පැවති මහනුවර ආසනය සඳහා අතුරු මැතිවරණයේ දී ශ්‍රීලනිපය පරාජයට පත්විය. 1955 මැයි මාසයේ දී අලුත් නුවර ආසනය සඳහා පැවති අතුරු මැතිවරණයේ දී ශ්‍රීලනිපය පරාජයට පත් විය. එම අතුරු මැතිවරණයෙන් ශ්‍රීලනිපය ලබා ගත්තේ තුන්වැනි තැනය. මෙවන් තත්ත්වයක තිබූ ශ්‍රීලනිපය 1956 අප්‍රියෙල් මාසයේ දී ආණ්ඩුවක් පිහිටුවා ගත්තේ කෙසේද යන්න ඇත්තෙන් ම ප්‍රශ්නයකි. වසරක් තුළ දී මෙසා විශාල පිම්මක් පැනීමට ශ්‍රීලනිපයට ශක්තියක් ලබාදුන්නේ කවුරුහු ද? 56 ජයග්‍රහණයේ රහස සොයාගත හැක්කේ මෙතැනිනි. දෙදහස් පන්සිය වැනි බුද්ධ ජයන්තිය නිමිති කරගෙන ජාතික ව්‍යාපාරය නිදහස උදෙසා සටනක් දියත් කරමින් සිටියේ මේ කාලයේය. " සිංහලය වහල් ව තිබියදී කුමන බුද්ධ ජයන්තියක් දැයි" තල්පාවිල සීලවංශ හිමි වදාළ ප්‍රකාශය මගින් ජාතික ව්‍යාපාරය තමන් දිනාගත යුතු නිදහස ලෙස අර්ථකථනය කළේ කුමක්දැයි **තේරුම් ගත හැකිය**. 1815 රට ම ඉංග්‍රීසින්ට යටත් වීමෙන් පසු සිවු ආකාරයක නිදහස් සටන් රට පුරා පැන නගින්නට විය. ඩොමිනියන් තත්ත්වයේ නිදහසක් පැතූ ලංකා ජාතික සංගමය ප්‍රමුඛ බලවේගය ඉන් එකකි. ඔවුන් නිදහස යන්න අර්ථකතනය කර තිබුණේ රැජිනගේ කිරීටයට යටත් ව මෙරට පුරවැසියන් විසින් මෙරට පාලය කිරීම ය. මේ තත්ත්වය තුළ සීමා සහිත දේශපාලන නිදහසක් පමණක් හිමි වූ අතර " කළු සුද්දන් ගේ" නිදහස ලෙස මෙය හැඳින්විණි.

1917 ඇති වූ සෝවියට් විප්ලවය නිසා බ්‍රිතාන්‍යයෙන් නැගී ආ මාක්ස්වාදී ව්‍යාපාරය ආස්වාදය කරගත් තවත් පිරිසක් නිදහස උදෙසා සටන් කරමින් සිටියහ. සම සමාජ හා කොමියුනිස්ට් පක්ෂ ප්‍රධාන වශයෙන් මේ ගණයේ ලා ගිණිය හැකි ය. ආර්ථික හා දේශපාලන නිදහසකට පමණක් සීමා වූ ඔවුන් ගේ නිදහසේ ඉලක්කයට පදනම් වී තිබුණේ යුරෝපයේ ඇති වූ මතවාදයක් වූ මාක්ස්වාදය යි. සංස්කෘතික හා මතවාදීමය නිදහස පිළිබඳ ව මේ පිරිස සැලකිල්ලක් නොදැක්වූ හ. විද්‍යාලංකාර පිරිවෙනේ භික්ෂු සංඝයා වහන්සේ

කිහිප නමක් ද මේ ව්‍යාපාරයේ කොටස් කරුවෝ වූහ.

හෙන්රි ස්ටීල් ඕල්කොට් ගේ ලංකා ගමනයෙන් ඇති වූ පරම විඥානාර්ථ ව්‍යාපාරය සමඟ ගමන් කළ බෞද්ධ පිරිස ගේ ව්‍යාපාරයක් ද මේ නිදහස වෙනුවෙන් යම් සටනක මේ කාලයේ නිරත විය. ඔවුන් ගේ ව්‍යාපාරයට ප්‍රධාන වශයෙන් ම හසු වී තිබුණේ අධ්‍යාපනය යි. ක්‍රිස්තියානි ඉංග්‍රීසි අධ්‍යාපන මාදිලිය වෙනුවට බෞද්ධ ඉංග්‍රීසි අධ්‍යාපන මාධ්‍යයකින් යුත් පාසල් ඇති කරවීම මේ ව්‍යාපාරයේ ඉලක්කය වී තිබිණි. ඉන් ඔබ්බට මේ ව්‍යාපාරය විහිදී ගොස් නොතිබිණි.

මේ තෙවර්ගයේ ම නිදහස් සටන් අධිරාජ්‍යවාදය මුළුමනින් ම පරාජය කිරීම සඳහා යොමු නොවීය. යම් තාක් දුරකට අධිරාජ්‍ය වාදයේ පැවැත්මට යටත් නිදහසකට මේ තෙගොල්ලෝ ම එකඟ වූහ. සැබෑ නිදහස යනු සකලාකාරයෙන් ම ලබා ගන්නා නිවහල් බව බැව් අවධාරණය කළේ ජාතික ව්‍යාපාරය පමණි. 1815 දී නැති වූ නිදහස ලබා ගැනීම ජාතික ව්‍යාපාරයේ ඉලක්කය විය. 1817-1818 නිදහස් සටන, 1848 නිදහස් සටන ඔස්සේ ආ මේ ජාතික ව්‍යාපාරය පංච මහා වාද, ධර්මපාලතුමා ගේ ව්‍යාපාරය, කුමාරතුංග මුනිදාස ගේ භාෂා සටන, පියදාස සිරිසේනයන් ගේ සාහිත්‍ය මෙහෙවර තිබෙට් මහින්ද හිමියන් ගේ කාව්‍ය මෙහෙවර ආ පිය මගින් සනිටුහන්ව තිබිණි.

ඩොමිනියන් තත්ත්වයේ නිදහස බලාපොරොත්තු වුවන්ගේ පැතුම ඉටු කරමින් 1948 දී ඒ තත්ත්වයේ නිදහසක් බ්‍රිතාන්‍යයෝ රටට ලබා දුන්නෝය. එහෙත් පැහැදිලිව පෙනී ගිය කරුණක් වූයේ පොඩි කුඩුවෙන් ලොකු කුඩුවට යෑමක් මිස කුඩුවෙන් එළියට යෑමක් ඒ නිදහසින් සිදු නොවූ බවය. වසර අටකට පසු 56 වන විට බුද්ධ ජයන්තියේ පිබිදීමත් සමඟ ජාතික ව්‍යාපාර තමන්ගේ නිදහස් සටනට යළි එළඹෙන ලකුණු පළ කර තිබිණි. ඊට පදනම වැටෙන්නේ බෞද්ධ කොමිෂන් සභාව හරහාය. මුලින් ම මෙවැනි කොමිෂන් සභාවක් පිළිබඳ අදහස, මහාචාර්ය ගුණපාල මලලසේකර මහතා ප්‍රමඛ බෞද්ධ නියෝජිත පිරිසක් විසින් අගමැති ඩී.එස් සේනානායක මහතාට ඉදිරිපත් කර තිබිණි. සාවධානව එම යෝජනාවට සවන් දුන් අගමැතිවරයා එම යෝජනාව පරිදි කොමිෂන් සභාවක් පත් කරන බව කීවේය. මෙම කොමිෂම සඳහා සුදුසු පුද්ගලයන් ගේ නම් ලැයිස්තුවක් ද අගමැති සේනානායක මහතා විසින් ඒ මොහොතේ ඉල්ලා තිබිණි. සාකච්ඡාවේ දෙවෙනි වටයේ දී අගමැති සේනානායක මහතා තමන් දුන් පොරොන්දුව කඩකරමින් බෞද්ධ කොමිසමක් පත් කිරීමට තමාට හැකියාවක් නොමැති බවත් ඒ ගැන බෙහෙවින් කණගාටු වන බවත් සඳහන් කර තිබිණි. එයින් නොසැලුණු ජාතික ව්‍යාපාරයේ නායකයන් තමන් විසින් පත් කර ගන්නා ලද කමිටුවක් මගින් අදාළ කර්තව්‍යයේ නියළෙන්නට වූහ. මේ කමිටුව දිවයිනේ නොයෙක් දෙස ගමන් කර සාකච්ඡා වාර්තා එක්රැස් කර ගත්තේය. මේ කරුණු ගොනු කිරීමේ මුළුමහත් වගකීම ම දැරුවේ එල්.එච් මෙත්තානන්දයන්ය. එසේ ම වාර්තාවේ ඇති අධ්‍යාපන පරිච්ඡේදය මුළු මනින් ම සකස් කළේ ද මෙත්තානන්ද ය.

මෙත්තානන්ද ගේ මෙහෙවර වැදගත් වන්නේ මේ නිසා ම පමණක් නොවේ. බෞද්ධ කමිටුවේ වාර්තාවෙන් ජාතික ව්‍යාපාරය බලාපොරොත්තු වූ කාරණ කිහිපයක් විය. ඉන් ප්‍රධාන තැනක් ගත්තේ අධිරාජ්‍යයවාදීන් ගෙන් බෞද්ධයන්ට වූ අසාධාරණය සොයා බලා, ඒවාට පිළියමක් යෝජනා කිරීමය. මෙය පූර්ණ නිදහස කරා ගෙනයන සටනේ වැදගත් අවස්ථාවක් විය.

මහනුවර රජ කළ නරේන්ද්‍රසිංහ රජු මදුරා පුරයෙන් බිසවක ගෙන්වා ගැනීම සිංහල රාජ පරපුර ලෙසින් පැවතීම අවසන් කරන්නා වූ කාරණයක් බවට පත් විය. නරේන්ද්‍රසිංහ රජු ගෙන් පසු ඔහු ගේ බිසව ගේ සොහොයුරා ශ්‍රී විජය රාජසිංහ නමින් රජ විය. ඔහු ගේන් ඇරඹෙන නායක්කර් වංශික රාජ පරපුර ශ්‍රී වික්‍රම රාජසිංහ රජු තෙක් සිංහල රාජ පරපුර පවත්වාගෙන ගියේ ය. ඉංග්‍රීසීන් උඩරට රාජ්‍යය අත්පත් කර ගැනීමත් සමග ම සිංහල පාලන ව්‍යුහය මුළුමනින් ම උඩු යටිකුරු විය. චෝල, පාණ්ඩ්‍යය කේරල ආදී ද්‍රාවිඩ ආක්‍රමණිකයන් මෙරට ආක්‍රමණය කළ මුත් ඔවුහු මෙරට පාලන ව්‍යුහය පවත්වාගෙන ගියෝය. එහෙත් පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි එසේ නොවූහ. ඔවුහු මෙරට පාලන ව්‍යුහය සම්පූර්ණයෙන්ම වෙනස් කළෝය. රාජ ආණ්ඩු ක්‍රමය අහෝසි කළහ. ඒ වෙනුවට බ්‍රිතාන්‍යය කිරීටයෙන් පත්කරනා ආණ්ඩුකාර වරයා ගේ මූලිකත්වයෙන් යුත් නියෝජිත පාලන ක්‍රමයක් මෙරට පිහිටුවා ලූහ. සිංහල රාජ්‍යයේ පැවති රාජකාරී ක්‍රමය අහෝසි කොට විශාල ආර්ථික පෙරලියක්ද ඉංග්‍රීසීහු රටට හඳුන්වා දුන්නෝය.වැවිලි ආර්ථිකය හා නව ආණ්ඩු ක්‍රමය හේතුවෙන් රාජ්‍යත්වය පිළිබඳ ව මෙරට වැසියන්ට නුහුරු ක්‍රමවේදයක් බලෙන් ම පැටවී තිබිණි. මේ තුළ වඩාත් අර්බුදකාරී තත්වයකට මුහුණ පාන්නේ නිදහස් සටන් දියත් කළ ජාතික බලවේගය. සිංහල ලේ ඇති රාජපරපුර සොයාගත නොහැකි ආකාරයකට අවුල් වීම, නායක්කාර් වංශිකයන් ගේ රාජපරපුරත් සමග සිදුවීම නිසාවෙන් ජාතික සටන්වල දී නායකයා ලෙස පෙන්වීමට කෙනෙකු නොමැති වීම නිදහස් සටන ජනතාවට දැනෙන නායකයකු යටතේ කරගෙන යාමට නොහැකි වීම, ඒ අර්බුදයයි. මේ නිසා එතෙක් උඩරට පැවැති රාජ පරපුරේ නායකයකු වෙනුවට මුහුදු බඩින්, පුරන්අප්පු සටනේ නායක්තවයට ගෙන ඒමට ජාතික ව්‍යාපාරයට සිදුවිය.

එතැනින් අනතුරු ව නායකයකු නොමැති ව සටනට විරාමයක් ලබාදීම 56 බෞද්ධ කමිටු වාර්තාවේ එක් අරමුණක් විය. රාජා සොයාගොස් දන ගසන මඟුල් ඇතකු සේ රට පුරා ජනතාව ගෙන් ලබා ගත් තොරතුරු අනුව සකස්කළ වාර්තාව පිළිගන්නා ප්‍රතිපත්තිමය නායකයකු සොයාගැනීමට ජාතික ව්‍යාපරය මේ අවස්ථාව උපයෝගී කර ගත්තේය. පිටු 256 න් යුත් බෞද්ධ කමිටු වාර්තාව 1956 පෙබරවාරි හතර වෙනිදා කොළඹ ආනන්ද විද්‍යාලයේ දී ජාතියට පිළිගන්වන්නේ පූර්ණ නිදහස දිනා ගැනීමේ දේශපාලන ඉලක්කය ඇතිවය. එල්.එච් මෙත්තානන්ද මහතා ගේ කාර්යභාරය යුග මෙහෙවරක් වන්නේ මේ අවස්ථාවේදීය. ලෝක කොමියුනිස්ට් ව්‍යාපාරයේ කීර්තිමත් යුගයක් ඇති කරමින් කොමියුනිස්ට් රාජ්‍යයක් ලෙස සෝවියට් දේශය බිහිවන මේ යුගයේ දී බ්‍රිතාන්‍යය වැනි රටවල ද මාක්ස්වාදය තදින්ම පැතිර ගොස් තිබිණි. උසස් අධ්‍යාපනය සඳහා බටහිර රටවලට ගිය ආසියානු තරුණයන් මාක්ස් වාදයෙන් මත් වීම මේ නිසා සිදුවිය. ඇමරිකාවේ උසස් අධ්‍යාපනය සඳහා ගිය පිලිප් ගුණවර්ධන, බ්‍රිතාන්‍යයේ උසස් අධ්‍යාපනය සඳහා ගිය එස්.ඒ .වික්‍රමසිංහ ඇන්. ඇම්. පෙරේරා කොල්වින් ආර් ද සිල්වා වැනි පුද්ගලයෝ හැරල්ඩ් ලැස්කි වැනි මාක්ස් වාදී උගතුන් ගේ ඉගැන්වීම් අනුව මාක්ස් වාදීන් වී ලංකාවට පැමිණියහ. ආසන්න කාලයේ දී ම ලන්ඩන් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ මෙත්තානන්ද ඒ මඟට යොමු වුණේ නැත. මෙත්තානන්ද සතුව මාක්ස්වාදියකු වීමේ සියලු සුදුසුකම් තිබිණ. අධිරාජ්‍යවාදීන්ට එරෙහි වූවකු වීම සමාජ සාධාරණය, මානව භක්තිය ඇත්තකු වීම මෙත්තානන්ද තුළ තිබුනේ ගුණාංගය නමුත් මෙත්තානන්ද ඒ රැල්ලට හසු වුනේ නැත.

සෝවියට් දේශය යූරි ගගාරින් අභ්‍යාවකාශයට යවා, ලයිකා බැල්ල සඳට යැවූ මේ කාලයේ සෝවියට් විප්ලවයට මේ ගුණාංග ඇති අයකු වසඟ වීම පුදුමයට කරුණක් නොවේ. එය අනිවාර්යයි. එහෙත් මාක්ස් වාදය පිළිබඳ ව ගැඹුරු හැදෑරීමක් මෙත්තානන්දයන් තුළ තිබුනේ යැයි කිව හැක්කේ ඔහු ඒ මාක්ස් වාදී රැල්ලට හසු නොවීම නිසා ය. ඒ වෙනුවට ඔහු තෝරාගත්තේ අනගාරික ධර්මපාල තුමා විසින් ශේෂ කර තිබූ ජාතික මඟය. උඩකැන්දවෙල හිමි වැනි දේශපාලනය පිළිබඳව උනන්දුවක් දැක්වූ විද්‍යාලංකාරයේ බොහෝ හිමිවරුන් පවා මාක්ස් වාදය සමග අනුගත වෙමින් පැවති යුගයක මෙත්තානන්ද තෝරා ගත්තේ ජාතික ව්‍යාපාරයේ මඟය.එකල මාක්ස වාදයට යොමු නොවූ දේශපාලන උනන්දුව ඇති පුද්ගලයෝ ලිබරල් වාදී මගේ සටන් කළහ. මෙත්තානන්ද මහතා ඒ මඟ ද නොගත්තේ ය.

මේ කඳවුරු දෙකට අයත් නොවූ බෞද්ධ ගිහි උගත්හු බොහෝ දෙනා ඕල්කට් බෞද්ධයන් බවට පත් වූහ. මහාචාර්ය මලලසේකර වැන්නන් වඩා සමීප වන්නේ ඒ ගොඩටය. ඕල්කට් බෞද්ධයන් ගනයට නොවැටුණු තවත් සමහර බෞද්ධ නායකයන් ජාතික ව්‍යාපාරයට තම ආර්ථික හයියෙන් උදවු උපකාර කරමින් තමන් ගේ ධනය ඒ වෙනුවෙන් කැප කළහ. එන්. කිව්. දියෙස් මහතා වැන්නන් අයත් වන්නේ ඒ ගොඩට ය. මෙත්තානන්දයන් මේ සියල්ලන් අබිබවා ඉදිරියට පැමිණෙන්නේ ඔහු සතු ව තිබූ ජාතික ව්‍යාපාරය පිළිබඳ ව ගැඹුරු දේශපාලන ඥානික භාවය නිසාය. ඔහු ජාතික ව්‍යාපාරය දේශපාලනික ව ජයග්‍රහණය කිරීමේ වටිනාකම තේරුම් ගත්තේ ය. න්‍යාය වාදීන් සමග න්‍යායෙන් හැප්පෙමින් ද, බලය ඔස්සේ බලපෑම් කළ හැකි කණ්ඩායම් සමග බලය ඔස්සේ හැප්පෙමින් ද කටයුතු කිරීමේ අර්ථය මෙත්තානන්ද මහතා මැනවින් වටහාගෙන තිබිණි. න්‍යාය සටනින් තොර බලය වල්මත් වීමක් බවත්, ඉලක්ක ගත නොවූ න්‍යාය හටන හිස් පිට්ටනියක කඩුවක් වන වනා ඔහේ සිටීමක් බවත් මෙත්තානන්ද මහතා තේරුම් ගෙන තිබිණි.

මෙත්තානන්ද මහතා ධර්මපාල තුමා ගෙනගිය යෂ්ටිය අතට ගෙන ජාතික ව්‍යාපාරය ඔස්සේ තම සටන ආරම්භ කළේය. ජාතික ව්‍යාපාරය 1956 දී දේශපාලන සටනක් කරා මෙහෙයවීම සිදුවන්නේ මෙත්තානන්ද මහතා ගේ මේ ගමනය. 1955 මැයි මාසය වන විටත් රටේ තීරණාත්මක දේශපාලන බලවේගය නොවූ ශ්‍රීලනිපය, ම.එ.පෙ ලෙස රාජ්‍ය බලය පිහිටුවන්නේ මෙත්තානන්ද මහතාගේ දේශපාලන සවිඥානිකත්වය සහ ඔහු ජාතික ව්‍යාපාරයේ මඟ නියම ලෙස හඳුනා ගැනීම නිසාය. අනගාරික ධර්මපාල තුමා තම දිනපොතේ සටහන් කර ඇති පරිදි " තව වසර 30න් නවසීලන්තයට වගේ අපිටත් ඩොමීනියන් තත්ත්වයක් ලබා දෙනවා. එවිට අප රට ආණ්ඩු කර ගන්න අප දැන ගත යුතුයි. ශිල්ප, කර්මාන්ත, විද්‍යා ඉගෙන ජපන්නු යුරෝපීයයන් පරාජය කළහ. අපේ සිංහල තරුණයෝ නීතිය හා වෙදකම පමණක් ඉගෙන ගැනීමට වීර්යය කරති. ශිල්ප කර්මාන්ත ගැන කල්පනා නොකරන උදවිය දුගී වන්නේය." ධර්මපාල තුමාගේ අනාවැකිය සනාථ කරමින් බ්‍රිතාන්‍යය මෙරටට වසර කිහිපයකින් නිදහස ලබා දුන්නේය. එහෙත් එය දේශපාලන වශයෙන් අර්ථවත් කර ගැනීමේ මඟක් මෙරට ජාතික ව්‍යාපාරය සතුව නොවීය. දේශපාලන ජයග්‍රහණයක් ලබා රට නිදහස් කරගැනීමේ මඟ ධර්මපාල තුමාට පවා කල්පනා වී තිබුණේ නැත. එල්.එච් මෙත්තානන්ද මහතාගේ ජාතික මෙහෙවර දියත් වී තිබුණේ දේශපාලන සටනක් ලෙසය මේ නිසා ජාතික ව්‍යාපාරයට '56 දී දේශපාලන ජයග්‍රහණයක් ලබා ගැනීමට හැකිවිය. ඉතා කෙටිකාලයක දී හෙවත් වසර දෙකක පමණ කාලයක දී මේ ජයග්‍රහණය ලබා ගත හැකිවීම නිසා එල්.එච් මෙත්තනන්ද මහතාගේ මෙහෙවර ක්ෂණික ප්‍රතිඵල පෙන්වන්නට විය. එසේ ම අධිරාජ්‍ය වාදීන් ගේ ආක්‍රමණයෙන් පසු මෙතෙක්

ජාතික ව්‍යාපාරය ලද විශාලතම ජයග්‍රහණය ද මෙත්තාන්නද මහතා මෙහෙයවූ ' 56 ජයග්‍රහණයයි. ඉතා කෙටි කාලයක දී මෙම ජයග්‍රහණය ලබා ගැනීමට හැකි වීම නිසා මෙත්තානන්ද මෙහෙවර පිළිබඳව ජනතාව දැනුවත් වීම වැළකී ගියේය. මෙත්තානන්ද මහතා ප්‍රධාන වශයෙන්ම පනස් හයට මුල් ගල තබන්නේ භාෂා සටන තුළින් සිංහලය පමණක් රාජ්‍ය භාෂාව කිරීමේ ප්‍රතිපත්තිය රට හමුවේ තබමිනි. තමා ගෙන ගිය මේ සටන් පාඨයන් 56 මැතිවරණයේ තීරක සාධකය බවට පත් කර ගැනීමට තරම් ඔහු දේශපාලන දක්ෂයෙක් වීය. අගමැති කොතලාවල 1954 සැප්තැම්බර් 13 දින යාපනයේ කරන ලද සංචාරයක දී කොකුවිල්හි දී සිංහල සහ දෙමළ යන දෙක ම රාජ්‍ය භාෂා බවට පත් කරන බවට කීමත් සමග එජාපයේ පරාජයට එය සාධකයක් කරවා ගැනීමට තරම් මෙත්තානන්ද ගේ දේශපාලනය එකල ප්‍රබලව තිබිණි. මැතිවරණය එළඹෙන විට ශ්‍රීලනිපය තම ප්‍රතිපත්තියක් ලෙස "බලයට පැමිණි පැය විසිහතරෙන් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම" පිළිගත්තේය.මැතිවරණයට ඔන්න මෙන්න කියා තිබියදී
කැලණි සම්මේලනයේදී එජාපය සිය භාෂා ප්‍රතිපත්තිය බවට සිංහල රාජ්‍ය භාෂාව කිරීම පිළිගත්තේය.දේශපාලනයේ ජයග්‍රහණය තීන්දු කිරීමට ජාතික ව්‍යාපාරයේ ප්‍රතිපත්ති යොදාගත හැකි ආකාරයේ බලයක් ඇති කරවා ගැනීමට තරම් දේශපාලන හැකියාවක් හා දූරදර්ශි භාවයක් මෙත්තානන්ද සතුවිය.

එහෙත් බණ්ඩාරනායක, අගමැති පුටුවට පත් වූ පසු ජාතික ව්‍යාපාරයට ලබාදුන් මේ පොරොන්දු කඩ කළේය. තමන් සමග සමීප ඇසුරක් පවත්වාගෙන ගිය බණ්ඩාරනායක නැගී ඉණිමඟ පාපහරින් බිම දැමීමට සැරසෙන විට හිත මිත්‍රකම් සියල්ල පසෙකලා යළිත් සටනට බැසීමට මෙත්තානන්ද තීරණය කළේය. " අගමැතිතුමාට විවෘත සංදේශයක්" නමින් එකල තිබු ලංකාදීප පුවත්පතට ලිපියක් ලියූ මෙත්තානන්ද මහතා සිය විරෝධය බණ්ඩාරනායකට එළිපිට ම පළ කළේය. මේ පොතේ මෙත්තානන්ද ලියූ එම ලිපියද ඇතුළත් ය. ජාතික ව්‍යාපාරයේ දේශපාලන මඟ තැනි ඇත්තේ ශ්‍රීලනිපය හෝ ම.එ පෙ මත නොවන වග මෙත්තානන්ද මහතාට 56 ජයග්‍රහණයට පෙර සිටම පසක් වී තිබිණි. එක්සත් භික්ෂු පෙරමුණ '56 ආණ්ඩුවේ අධ්‍යාපන ඇමති තනතුර ලබා ගන්නා ලෙස මෙත්තානන්දට ඇරයුම් කර තිබුණත් ඔහු තම දේශපාලනය කොතන දැයි තීරණය කර එය භාර නොගත්තේය. අගමැති බණ්ඩාරනායක " මේ හිසරදයෙන් ගැලවීමට යැයි සිතාගෙන" දෝ බුරුම රටේ තනාපති තනතුර මෙත්තානන්දට පිරිනැමුව ද මට වැඩ කරන්න තියෙන්නේ ලංකාවේ යැයි කියමින් ඔහු එම තනතුර ද ප්‍රතික්ෂේප කළේය. බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම අත්සන් කරමින් ජාතික ව්‍යාපාරය අමතක කර බණ්ඩාරනායක කටයුතු කිරීමත් සමග අනුන්ට මුක්කු නොගසන ජාතික ව්‍යාපාරයක් වු දේශපාලනයක් කළ යුතු යැයි මෙත්තානන්ද මහතා තීරණයකට එළඹුණේය. මාක්ස් වාදයට අනුව යන සමාජයත්, ලිබරල් නිදහසට අනුව යන නිදහස් සමාජයත් බලාපොරොත්තුවෙන් දේශපාලනය කරනා අනුකාරයක් නො වී ජාතික ව්‍යාපාරයට අනුව ධර්ම සමාජයක් බිහි කර ගැනීමේ ඉලක්කය ඇතිව ධර්ම සමාජ පක්ෂය මෙත්තානන්ද නිර්මාණය කළේ මේ අරමුණිනි. අමැති ජාතික ව්‍යාපාරයේ ජයග්‍රහණයෙන් 56 දී අගමැති පුටුවට ආ බණ්ඩාරනායක මෙත්තානන්දගේ ප්‍රතිපත්ති අමතක කළ ද ඔහු කළ බලපෑමෙන් මිදීමට ශ්‍රීලනිපයට තවමත් නොහැකි වී ඇති. සිරිමාවෝ අගමැතිනිය විසින් පාසල් රජයට පවරා ගනිමින් මිසනාරි අධ්‍යාපනයේ තටු සිඳ දැමුවේ මෙත්තානන්ද එල්ල කර බලපෑම් හමුවේය. එහෙත් මෙත්තානන්ද මහතා නායකත්වය සැපයූ ධර්ම සමාජ පක්ෂය දේශපාලන ව්‍යාපාරයක් ලෙස වර්ධනය නොවිණි. ධර්ම සමාජ පක්ෂය දේශපාලන ව්‍යවහාරයක් ලෙස පවතින අතර ම 65' කේ.එම්.පී රාජරත්න මහතා නායකත්වයේ ක්‍රියාත්මක වූ ජාතික විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තු ආසන කිහිපයක් දිනා ගත්තද එම ව්‍යාපාරය ද ඉදිරියට ගියේ නැත. මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් ම බලපෑවේ අධිරාජ්‍යවාදය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂය ප්‍රතිපත්ති දෙකක් අනුගමනය කළත් පෙඩරල් පක්ෂය ඇතුළු දෙමළ ජාතිවාදය හමුවේ අවස්ථාවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමය. මෙම තත්වය තුළ ජාතික දේශපාලන ව්‍යාපාරයකට ස්වාධීන පැවැත්මක් නොවීය. 1972 ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේදී,1956 දී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමට එරෙහිව " එක් භාෂාවක් නම් රටවල් දෙකයි, භාෂා දෙකක් නම් එක් රටයි යනුවෙන් ප්‍රකාශ කළ කොල්වින් ආර්. ද සිල්වා මහතාට සිංහල භාෂාව රාජ්‍ය භාෂාව ලෙස 72 ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමෙන් මෙම තත්ත්වය පැහැදිලි වේ. 1977 දී බලයට පැමිණි එ.ජා පක්ෂය තුළ සිට සිරිල් මැතිව් මහතා කටයුතු කළ ආකාරයත් මීට ඇති තවත් උදාහරණයකි. කේ.එම්.පී රාජරත්න මහතා ගෙන් පසු ව සිංහල අයිතිය වෙනුවෙන් පෙනී සිටිය ප්‍රධාන නායකයා සිරිල් මැතිව් මහතා ය.

තත්ත්වය එසේ වූවත් 1983 න් පසුව මෙ තත්ත්වය වෙනස් විය. දෙමළ ජාතිවාදී ත්‍රසතවාදය හමුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එ.ජා පක්ෂය තුළින් සිටි ස්ථාවරවලින් ක්‍රමානුකූල ව පසු බසින්නට විය. මීට ඇති හොඳ ම උදාහරණය වන්නේ ඉන්දු ලංකා ගිවිසුම සහ මංගල මුණසිංහ කමිටු වාර්තාවයි. මංගල මුණසිංහ කමිටු වාර්තාව මගින් පළාත් සභාවට වඩා බලතල හිමි ආයතනයක් උතුරු පළාතට හා නැගෙනහිර පළාතට නිර්දේශ කළ විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව සහ එවකට විපක්ෂ නායිකාව වූ සිරිමාවෝ මහත්මිය

ඊට එකඟ වූවාය. මෙම තත්ත්වය තුළ යළිත් කටයුතු කිරීම වෙනුවෙන් පෙනී සිටින ව්‍යාපාරයක අවශ්‍යතාව මතු විය. මෙම අවශ්‍යතාව ඉටු කිරීම සඳහා ව්‍යාපාර කිහිපයක් ද බිහි විය. මෙම තත්ත්වය තුළින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත්, එක්සත් ජාතික පක්ෂයටත් ගැති නොවූ සිංහල ජාතික ව්‍යාපාරයක අවශ්‍යතාව තේරුම් ගනිමින් ධර්ම සමාජ පක්ෂය බිහිකිරීමට මෙත්තානන්ද මහතා දූරදර්ශී වූ බවය. මෙත්තානන්ද මහතා ඇතුළු පිරිස බිහිකළ ධර්ම සමාජ පක්ෂය දේශපාලනය ව්‍යාපාරයක් ලෙස වර්ධනය කර ගැනීමට සමත් වූයේ නම් 1987 න් පසු ව ජාතික ව්‍යාපාරය මෙතරම් අසරණ භාවයට පත් නොවන බව පැහැදිලිය. රටත්, ජාතියත් පත්වූ ගැටලු සහගත තත්වයෙන් මුදා ගන්නේ ප්‍රධාන පක්ෂ දෙකකට එරෙහිව නැගී සිටි ජනතා විමුක්ති පෙරමුණ හෙවත් එය සතු දේශපාලන බලයයි. ජ.වි.පෙරමුණ මෙසේ දේශපාලන අභියෝගයක් නොවන්නට ප්‍රධාන පක්ෂ දෙකම දෙමළ ජාතිවාදීනගේ ත්‍රස්තවාදයේ බලපෑම් හමුවේ මීට වඩා බොහෝ දුර ඒ පැත්තට තල්ලු වීමට ඉඩ තිබිණි. මේ නිසා ජාතික ව්‍යාපාරයට ජ.වි.පෙ මත යැපීමට සිදු විය . මෙසේ ජනතා විමුක්ති පෙරමුණේ බලය මත රැඳී සිටීමට සිදුවී ඇත්තේ ධර්ම සමාජ පක්ෂය දේශපාලන පක්ෂයක් ලෙස වර්ධනය කර නොගැනීමේ හේතුවෙනි. ධර්ම සමාජ පක්ෂය දේශපාලන ව්‍යාපාරයක් ලෙස වර්ධනය වී තිබුණේ නම් අද රටේ දේශපාලනය මීට වඩා හාත්පසින් ම වෙනස් වන බව පැහැදිලිය. මෙ සියලු සාධකයන් ගෙන් පෙනී යන්නේ මෙත්තානන්ද මහතා කෙතරම් දූර දර්ශීව කටයුතු කළ ද යන්නයි. අද රටත් ජාතියත් වෙනුවෙන් කළ යතු ප්‍රධාන දෙය වන්නේ මෙත්තානන්ද මහතා දුටු ආකාරයට ම ප්‍රධාන පක්ෂ දෙකට ම විකල්ප දේශපාලන ව්‍යාපාරයක් ලෙස ජාතික ව්‍යාපාරයක් ගොඩ නගා ගැනීමයි.

ඒ මෙත්තානන්ද මහතා අදට අදාළ වන ආකාරයයි. ධර්මපාල තුමා පවා ඩොමීනියන් තත්වය තුළ ලබාගත හැකි බව විශ්වාස කළ නිදහස එසේ දිනාගත නොහැකි බවත්, ඒ සටනට අවශ්‍ය යාන්ත්‍රණයත්, එය ඉදිරියට පවත්වාගෙන යාමට ගත යුතු පියවර පෙන්වාදීමත් මෙත්තානන්ද මහතා ගේ කාර්යය භාරය ලෙස සඳහන් කළ හැකි අතර ඔහු ධර්මපාල තුමා ගෙන් පසුව ජාතික ව්‍යාපාරය තුළ බිහි වූ ප්‍රධාන නායකයා ලෙසත් අවිවාදයෙන් පිළිගත හැකිය.